# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2216/11 - 2021 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා - 2021.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ, කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2006 ජුනි මස 09 වන දින අංක 1448/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, එහි I වන තීරයේ දක්වෙන "වෛද්‍ය පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දක්වෙන "1. කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය" සහ "6. ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය" යන සටහන් වෙනුවට පිළිවෙලින් "1. කාය ව්‍යවච්ඡේද, ජාන විද්‍යාව සහ ජෛව වෛද්‍ය තොරතුරු විද්‍යා අධ්‍යයන අංශය" සහ "6. වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ ප්‍රතිශක්ති විද්‍යා අධ්‍යයන අංශය" යන සටහන් ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

මහාචාර්ය ජී. එල්. පීරිස්,
අධ්‍යාපන අමාත්‍ය.

2021 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 231

එල්.ඩී.බී. 21/78 (xv) (ඒ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (2020 ජූලි මස 30 වන දින අංක 2186/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2009 මැයි මස 28 වැනි දින අංක 1603/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ, "මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය" යන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට "මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය" යන අයිතමය ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 232

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.